**මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ**

**නීති නිලධාරි තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගැනීමේ පරිපාටිය**

**1. සම්බන්ධ වන ආයතන**

1.1දෙපාර්තමේන්තුව - මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු
යොමු අංකය:MRCA/A/92/2023` දිනය: 2024.12.05

1.2 අමාත්‍යාංශය - බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු
යොමු අංකය:MBRCA/01/05/76-නීති දිනය: 2024.12.11

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම
යොමු අංකය:DMS/1154/V-1 දිනය: 2023.10.30

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය
යොමු අංකය: EST-2/03REC/2511 දිනය: 2024.11.04

1.5 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය
යොමු අංකය:PSC/EST/05-01-37/01/2025 දිනය:2025.05.21

**2. පත්කිරීමේ බලධරයා : - රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**3. සේවා ගණය පිළිබඳ විස්තර**

3.1සේවා ගණය - විධායක

3.2ශ්‍රේණිය- III/II ශ්‍රේණි

3.3 පැවරෙන කාර්යභාරය පිළිබඳ නිර්වචනය: පොදු ස්වභාවය අනුව ප්‍රතිපත්ති සම්පාදනය, විධානය/ අණදීම, කළමනාකරණ හා සම්බන්ධ තීරණ ගැනීම යන කාර්යයන් ඇතුළත් වූද ආයතනයේ ඉහළම විධායක නිලධාරියාට පැවරෙන සමස්ථ කාර්යභාරයේ අන්තර්ගත කාර්යයන් අතරින් තනතුර නිශ්චිත කොට පවරාදෙනු ලබන කාර්යයන් පැවරෙන මෙම තනතුරට අයත් කාර්යයන් මෙම තනතුරට අයත් නිලධාරියාට පවරනු ලැබිය හැකිය.

**4. තනතුරෙහි/තනතුරුවල ස්වභාවය**

මෙම තනතුර කොන්ත්‍රාත් පදනම මත ඇති කල තනතුරක් වන අතර ස්ථිර පත්වීමක් ලබා ගැනීමට හෝ ස්ථිර නිලධාරින්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකම් නොමැති තනතුරකි.

සටහන : - රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක විය යුතුය.

**5.මාසික දීමනාව -**i.මාසික දීමනාව රු.47,615/-

ii.ජීවන වියදම් දීමනාව රු.17,800/-

## 6. සේවා ගණයට අයත් තනතුර/තනතුරු

6.1 කොන්ත්‍රාත් පදනම යටතේ බඳවාගැනීමට අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යය.

| අනුමත තනතුරු නාමය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| නීති නිලධාරි | 01 | 1. අලුතින් ලියාපදිංචි කිරීමට අයදුම් කරන පල්ලි හා පුණ්‍යාගාරවලට අදාළ ඔප්පුවල නීත්‍යානුකූලබව පරීක්ෂා කිරීම හා තහවුරු කිරීම.<br>2. පල්ලි හා පුණ්‍යාගාරවලට අදාළ ව්‍යවස්ථාව අනුමැතිය සඳහා වකුෆ් සභාවට යොමු කිරීමට පෙර වකුෆ් පනතට හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිදැයි පරීක්ෂා කර බැලීම.<br>3. ලියාපදිංචි කරන ලද පල්ලි හා පුණ්‍යාගාරවලට අදාල දේපලවල බදු ගිවිසුම් පිළියෙල කිරීමේ දී අවශ්‍ය නීති උපදෙස් දායක සභාවට ලබා දීම.<br>4. බාහිර පාර්ශවයන් වකුෆ් දේපල අවභාවිතා හා අත්පත් කර ගෙන ඇති අවස්ථාවල එම දේපල ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය නීතිමය කටයුතුවලට උපදෙස් ලබා දීම,අවශ්‍ය අවස්ථාවලදී අධිකරණය ඉදිරියේ පෙනී සිටීම හා ඊට අදාළ සියලුම කටයුතු.<br>5. මුස්ලිම් පල්ලි දායක සභාව වකුෆ් දේපළ අවභාවිතා කරන අවස්ථාවලදි ඔවුනට එරෙහිව ගොනු කරනු ලබන නඩු සම්බන්ධයෙන් කටයුතු කිරීම හා ඊට අදාළ සියලුම කටයුතු.<br>6. පල්ලි පරිපාලනය සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසමට පැමිණිලි ඉදිරිපත් කරන අවස්ථාවලදි අවශ්‍ය නීතිමය කටයුතු වලට සහාය ලබා දීම හා තොරතුරු දැනගැනීමේ පනත යටතේ තොරතුරු ලබා දීමේදී අවශ්‍ය නීතිමය උපදෙස් ලබාදීම හා කොමිෂන් සභාවේ අභියාචනා විමසීමේදි දෙපාර්තමේන්තුව වෙනුවෙන් පෙනී සිටීම.<br>7. අවිධිමත් ලෙස පරිහරනය කරන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද පුණ්‍යාගාර දේපළ නීත්‍යානුකූලව පවරා ගැනීමේ නීතිමය කටයුතු කිරීම.<br>8. වකුෆ් විනිශ්චය සභාව දිස්ත්‍රික් අධිකරණයකට සමානව ක්‍රියාත්මක වන අධිකරණයක් වේ. මෙමගින් මුස්ලිම් පල්ලි සහ පුණ්‍යාගාර ආදි නඩු කටයුතු අසනු ලබයි. එම කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ නීති නිලධාරින් සම්බන්ධවීමක් සිදු නොවන බැවින් එම අවස්ථාවල අවශ්‍ය නීතිමය කටයුතු කිරීම.<br>9. වකුෆ් විනිශ්චය සභාව විසින් දෙනු ලබන තීන්දුවලට එරෙහිව අභියාචනාධිකරණයට යන අවස්ථාවලදි දෙපාර්තමේන්තුව වෙනුවෙන් අභියාචනාධිකරණයේ පෙනී සිටීම, පල්ලි, පුණ්‍යභාරකාර දේපළ සහ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන අනෙකුත් ආයතනයන් සම්බන්ධයෙන් පැන නගින නීතිමය කටයුතු සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් හා සහාය ලබා ගැනීම. |

| | | |
|---|---|---|
| | | 10.හජ් නියෝජිත ආයතන හා වෙනත් පාර්ශව දෙපාර්තමේන්තු තීන්දුවලට එරෙහිව නඩු පවරන අවස්ථාවලදී නීතිමය උපදෙස් ලබා දීම.<br>11. හජ් මාර්ගෝපදේශයට එරෙහිව පැන නගින නීතිමය ගැටළු සම්බන්ධයෙන් සහාය ලබාගැනීම සහ අධිකරණයට ඉදිරිපත්වීම.<br>12.අරාබි විදුහල්, අහදියා දහම් පාසල් හා කුර්ආන් මද්රසා සම්බන්ධව සහ ඇතිවන නීතිමය ගැටළු සම්බන්ධයෙන් සහාය ලබා ගැනීම සහ අධිකරණයට ඉදිරිපත්වීම.<br>13.නේවාසික වීසා හා ග්‍රන්ථ ආනයන කිරීමේදී ඉදිරිපත් වන ගැටළු සම්බන්ධව නීතිමය කටයුතු කිරීම.<br>14.තොරතුරු දැනගැනීමේ පනත, මානව හිමිකම් කොමිෂන් සභාව, අල්ලස් හා දූෂණ කොමිෂන් සභාව සහ අනෙකුත් ආයතන විසින් ඉදිරිපත් කරනු ලබන නීතිමය ගැටළු වලට සහය ලබාදීම සහ අවශ්‍ය අවස්ථාවලදී පෙනී සිටීම.<br>15.ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන රාජකාරියට අදාළ වෙනත් කාර්යයන් |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 01

**7. බඳවා ගැනීමේ ක්‍රමය -**

7.1. බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |

7.2. විවෘත බඳවා ගැනීම

7.2.1.බඳවා ගන්නා ශ්‍රේණිය- III ශ්‍රේණිය

7.2.2.පළපුරුද්ද

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු නීතිඥවරයකු වශයෙන් වසර තුන (03)කට නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය ආයතනයක නීතිමය තනතුරක* වසර තුන (03) කට නොඅඩු පළපුරුද්ද ලබා තිබීම.

*නීතිමය තනතුරක් යනු නීති උපාධිය හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම දී තිබීම බඳවාගැනීමේ මූලික සුදුසුකමක් වන තනතුරුය.

7.3 කායික සුදුසුකම්: සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

7.4 වෙනත්

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(ii) අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(iii)අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

8.වයස

8.1 අවම සීමාව : අවුරුදු 21 ට නොඅඩු

8.2 උපරිම සීමාව : අවුරුදු 45 ට නොවැඩි

9. බඳවා ගැනීමේ ක්‍රමය - යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

9.1 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 | |
| 2. අතිරේක වෘත්තීය පළපුරුද්ද | 35 | |
| 3. භාෂා හැකියාව | 15 | |
| 4. තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම | 10 | |
| 5. සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන කුසලතාවය (සාමාන්‍ය දැනීම හා බුද්ධිය - 05 නීති ක්ෂේත්‍රයේ නූතන ප්‍රවණතා පිළිබඳ දැනුම - 05 පැහැදිලිව අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව සහ පෞරුෂත්වය - 05 | 15 | අදාල නොවේ |
| එකතුව | 100 | |

සටහන -

I. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතරින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

II. බඳවාගැනීම සිදු කරන අවස්ථාවේදී ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටිය අනුමත කිරීම පත්කිරීමේ බලධාරියා විසින් සිදු කරනු ලැබේ.

III. විස්තරාත්මක ලකුණු පරිපාටිය අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ප්‍රසිද්ධ කල යුතු වේ.

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන නිලධරයා -
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

9.2 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය - රජයේ ගැසට්පත්‍රයේ දැන්වීම් පළකිරීම/ප්‍රසිද්ධ පුවත්පත්වල දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ

10. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි:අදාළ නොවේ

11. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ : අදාළ නොවේ

12. සෑම පත්වීමක් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 හා 2022.12.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

13. මෙම බඳවාගැනීම් පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කළේ : අත්සන .- ..............................

(විෂයභාර නිලධාරී)

නම - එම්.එෆ්.ආර්. ෆර්වින්
තනතුර -සංවර්ධන නිලධාරී III
දිනය - 2025.08.21 .

පරීක්ෂා කළේ - අත්සන ..............................

(විෂය භාර මාණ්ඩලික නිලධරයා)

නම :එම්.අයි.පිර්නාස්
තනතුර :නියෝජ්‍ය අධ්‍යක්ෂ
දිනය : 2025.08. 21

නිර්දේශ කර ඉදිරිපත් කරමි

අත්සන ..............................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :එම්.එස්.එම්.නවාස්
තනතුර :අධ්‍යක්ෂ

දිනය: 2025 .08.21

නිලමුද්‍රාව එම්.එස්.එම්. නවාස් අධ්‍යක්ෂ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව අංක. 180, ටී.බී. ජයා මාවත, කොළඹ - 10.

14. අමාත්‍යාංශයේ නිර්දේශය

යොමු අංකය: ~~PSC~~ MBRCA/01/05/76 - සි.නි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2025.05.21 දින අනුමත කරන ලද මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවෙහි කොන්ත්‍රාත් පදනම මත නීති නිලධාරී තනතුර සඳහා වන යෝජිත බඳවා ගැනීමේ පරිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කරමි

අත්සන ..............................

නම :..............................

ලේකම් (අදාල අමාත්‍යාංශ ලේකම්)

දිනය 2025.09.01

නිල මුද්‍රාව ප්‍රින්ස් සේනාධීර ලේකම් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත, කොළඹ 07

---

15. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය

යොමු අංකය PSC/6ST/05-01-37/01/2025

මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවෙහි කොන්ත්‍රාත් පදනම මත නීති නිලධාරී තනතුර සඳහා වන යෝජිත බඳවා ගැනීමේ පරිපාටිය රාජ්‍ය සභා කොමිෂන් සභාව විසින් 2025-05-21 දින අනුමත කරන ලදී.

අත්සන ..............................

නම :..............................

ලේකම් (රාජ්‍ය සේවා කොමිෂන් සභාව)

දිනය 2025.10.21

නිල මුද්‍රාව : ඩබ්ලිව්.එච්.එම්.එම්.පී.කේ. දයාරත්න ලේකම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල